My No. එම්.10/විවිධ/ම/19/2002

තැපැල් පෙට්ටිය / த. பெ. இல. / P. O. Box No. 565

දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos. 2393071, 2393072

ෆැක්ස් අංකය / தொலைநகல் இல / Fax No. 2393074

ඊමේල් / மின்னஞ்சல் / E-mail rgdept@sltnet.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR — GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

280, මේන් වීදිය, කොළඹ 11.
280, பிரதான வீதி, கொழும்பு 11.
280, Main Street, Colombo 11.

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංකය :- 09/2006

දිනය / திகதி / Date 2006-08-2

සියළුම උප්පැන්න හා මරණ
ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**මුස්ලිම් ජාතිකයන්ගේ මරණ ලියාපදිංචි කිරීමේ දී**
**සිදුවන ප්‍රමාදයන් මගහරවා ගැනීම**

ඉහත කරුණ පිළිබඳව ම විසින් නිකුත් කර ඇති අංක එම්.10/විවිධ/ම/19/2002 හා 2003-04-10 වෙනි දිනැති චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛයේ පිටපතක් ද මෙයට අමුණා ඇත.

02. ඉස්ලාම් ආගමික අවමංගල්‍ය චාරිත්‍ර අනුව මරණයක් සිදු වී ඉතා කෙටි කාලයක් තුළ එම අවමංගල්‍යය සම්බන්ධව කටයුතු අවසන් කළ යුතුය. ඒ නිසා මුස්ලිම් ජාතිකයෙකුගේ මරණ ඉතා කඩිනමින් ලියාපදිංචි කරලීම අවශ්‍ය වේ. එහෙත්, ඇතැම් අවස්ථාවල දී එවැනි මරණ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කිරීමේ දී අදාළ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් නිවාඩු ලබාගැනීම නිසා හෝ වෙනත් අවශ්‍යතා සඳහා කාර්යාලයෙන් බැහැරවීම නිසා හෝ එකී මරණ කඩිනමින් ලියාපදිංචි කර ගැනීමට බාධා සිදු වී ඇති බව මා වෙත වාර්තා වී ඇත.

03. ඒ නිසා, සෑම රෙජිස්ට්‍රාර්වරයෙකුම නිවාඩු ලබා ගන්නා අවස්ථාවේ දී තම රාජකාරිය ඉටුකිරීමට විධිමත් ආදේශකයෙකු නම් කර පත්කර ගත යුතු බවත්, නිවාඩු ලබා නොගෙන දීර්ඝව කාර්යාලයෙන් බැහැරව නොසිටිය යුතු බවත් දන්වමි. එවැනි අවස්ථාවල දී තමන් වෙනුවට රාජකාරිය ඉටුකරන ආදේශක රෙජිස්ට්‍රාර්වරයාගේ නාම, ලිපිනය සහ දුරකථන අංකය යනාදී තොරතුරු තම කාර්යාලයේ ප්‍රදර්ශනය කළ යුතු අතර, වෙනත් හදිසි අවශ්‍යතාවයකට කාර්යාලයෙන් බැහැරව යන්නේ නම්, වහාම රෙජිස්ට්‍රාර්වරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ආදිය ද මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙසත් දන්වමි.

(එල්.කේ.රත්නසිරි)
රෙජිස්ට්‍රාර් ජනරාල්

එල්. කේ. රත්නසිරි
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - ඔබගේ දැනගැනීම සඳහා.
2. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැනගැනීම සඳහා.
3. ජාතික සභාපති, ශ්‍රී ලංකා මුස්ලිම් අවමංගල්‍ය (ජනාසා) සේවා සංවිධානය - ඔබගේ අංක 2006/සංවිධ්සර/සෙදු හා 2006-06-24දිනැති ලිපියට අදාළ වේ.

නාලි/31.M 10

චක්‍රලේඛ අංකය: 02/2003

මගේ අංකය: එම් 1.0/විවිධ/ම/19/2002
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 03.
2003.04.10

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
.....................

## මුස්ලිම් භක්තිකයන්ගේ මරණ ලියාපදිංචි කිරීමේදී සිදුවන ප්‍රමාදයන් මග හරවා ගැනීම

මුස්ලිම් භක්තිකයෙකු මියගිය විට එම අවස්ථාවේදීම එම දේහයේ අවසන් කටයුතු ඉස්ලාම් ධර්මයේ නීතියට හා සම්ප්‍රදායට අනුව හැකි ඉක්මනින්ම සිදු කිරීමට කටයුතු කළයුතු වේ.

02. නමුත් සමහරක් අවස්ථාවලදී මරණයක් ලියාපදිංචි කිරීමට උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් වරයෙකු හෝ වරියක ළඟට ගියවිට එම නිලධාරීන් වෙත පැවරී ඇති එම කාර්යය නිසි පරිදි කලට වේලාවට සිදුකර නොදීමේ හේතුවෙන් මියගිය තැනැත්තාගේ ඥාතීනට විවිධ වූ ගැටළුවලට මෙන්ම දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවේ. යම්කිසි මරණයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලිපිලේඛන නිත්‍යානුකූලව ඉදිරිපත් කළද මරණය ලියාපදිංචි කර ගැනීමට නොහැකි වීම මෙයට ප්‍රධානතම හේතුවයි.

03. විශේෂයෙන්ම සතියේ නිවාඩු දිනයන්හි මෙන්ම ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හිදී හා රාත්‍රී කාලයේදී මරණයක් ලියාපදිංචි කරදීමට අදාල රෙජිස්ට්‍රාර් මහත්ම මහත්මීන් තම රාජකාරීමය කටයුතු සිදු කිරීමට ඉදිරිපත් නොවීම නිසා මියගිය මුස්ලිම් භක්තිකයෙකුගේ දේහය සම්බන්ධයෙන් භූමදාන කටයුතු කරගත නොහැකිව මියගිය පුද්ගලයාගේ ඥාතීන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී ඇති බව වාර්තා වී ඇත.

04. මේ සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ සිටින උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කර මුස්ලිම් භක්තිකයන්ගේ මරණ හැකිතාක් ඉක්මනින් ලියාපදිංචි කර දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔවුනට උපදෙස් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. සභාපති, ශ්‍රී ලංකා මුස්ලිම් අවමංගල්‍ය සේවා සංවිධානය,
ඔබගේ අංක 145/5/69(vi) හා 2002.12.05 ලිපියට
අදාලව දැනගැනීම සඳහා
2. ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
ලේකම් - ඔබගේ අංක එම්පී/එල්ජී/8/අයි/I-IV-IV හා
2003.03.04 දිනැති ලිපියට අදාලව.